**ශීර්ෂය 272 - කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියලුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියලු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර, ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටුකර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 272 - කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජුනි 11 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.12 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව

ගණන්දීමේ නිලධාරි වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128 (1) ගණන්දීමේ නිලධාරීගේ ගිණුම්කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරීගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1) (අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසාදීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණභාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/ හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. අධි ප්‍රතිපාදනය | 2.8 (අ) |
| | | 2. වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය | 2.8 (ආ) |
| | | 3. අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගත් ව්‍යාපෘති | 2.3.1 |
| | | 4. නිම නොකර අත්හැර දමන ලද ව්‍යාපෘති | 2.3.2 |
| 128 (1) (ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | මහජනයා සඳහා සේවා ඉටු කිරීමේ අඩුපාඩු<br>අවිධිමත් ගනුදෙනු | 2.7<br>2.5 |

| | | | |
|---|---|---|---|
| 128(1) (ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | 1. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම<br>2. පොදු තැන්පත් ගිණුම | 2.11<br>2.10 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාපනය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිශ්කාෂණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.4 |
| 128 (1)(එ) | රජයේ කටයුතු ඉටුකිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත් බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව. | කළමනාකරණ දුර්වලතා | 2.6 |
| 128 (1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අය කරගැනීම කඩිනම් කිරීමට ගනු ලබන පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයක් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව, | හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අපොහොසත් වීම. | |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 2.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යභාරයන්

-------------------------------------------------------

(අ) රජයේ සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති රජයේ නියමයන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණය හා මඟ පෙන්වීම.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කටයුතු සම්බන්ධීකරණය හා මඟ පෙන්වීම.

(ඈ) ව්‍යවස්ථාපිත අණපනත්වලින් පැවරී ඇති බලතල හා වගකීම් ඉටු කිරීම.

(ඈ) වෙනත් රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල දිස්ත්‍රික් නියෝජ්‍ය ආයතනය වශයෙන් කටයුතු කිරීම.

(ඉ) දිස්ත්‍රික්කය තුළ නීතිය හා සාමය පවත්වාගෙන යාමටත්, ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීමටත්, ආරක්ෂක අංශය සමඟ මනා සබඳතාවයක් පවත්වා ගැනීම.

(ඊ) රාජ්‍ය ආදායම ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් නියෝජිතයෙකු වශයෙන් රාජ්‍ය ආදායම එකතු කිරීමේ හා ගිණුම්ගත කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.

## 2.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ආයතන හා එමඟින් ඉටුකල යුතු කාර්යභාරයන්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ගිරිබාව, ගල්ගමුව, ඇහැටු වැව, මහව, අඹන්පොල, කොටවෙහෙර, රස්නායකපුර, නිකවැරටිය, පොල්පිතිගම, ඉබ්බාගමුව, ගනේවත්ත, රිදීගම, මාවතගම, මල්ලවපිටිය, කුරුණෑගල, මාස්පොත, විරඹුගෙදර, පොල්ගහවෙල, අලව්ව, නාරම්මල, කුලියාපිටිය, නැගෙනහිර කුලියාපිටිය, බටහිර වාරියපොල, පඩුවස්නුවර නැගෙනහිර, පඩුවස්නුවර බටහිර, බමුනා කොටුව, කොබෙයිගනේ, බිංගිරිය උඩුදබාව සහ පන්නල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ස්ථාපිත කර තිබුණු අතර එම ආයතන විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ස්ථාපිත කර ඇති කාර්යයන් ප්‍රාදේශීය මට්ටමෙන් ඉටුකරනු ලැබේ.

## 2.3 ක්‍රියාත්මක කර තිබුණු දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

### 2.3.1 අපේක්ෂිත ප්‍රතිඵල ලබානොගත් ව්‍යාපෘති

(අ) 2014 දැයට කිරුළ ජාතික වැඩසටහන යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන මත බමුණාකොටුව ගෝන්නව පාලම අසල සිට බමුණාකොටුව මංසන්දිය දක්වා හා බමුණාකොටුව හන්දියේ සිට තිම්මාගම දක්වා ජලනල දීර්ඝ කිරීම සඳහා එකතුව රු.14,373,885 ක පිරිවැයක් දරා තිබුණද, මෙම ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට අනුව වාරියපොල ජල පිරිපහදුවේ දෙවන අදියර ක්‍රියාත්මක කරන තෙක් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ නොහැකිව තිබුණි.

(ආ) ජනාධිපති ලේකම් කාර්යාලයේ ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන මඟින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ අක්කර 950 ක වපසරියක රජයේ හා ප්‍රතිලාභීන්ගේ සම දායකත්වයෙන් මුං, කව්පි, රටකජු වගා කිරීම සඳහා රු.3,029,230 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. මෙම මුළු ප්‍රතිපාදන මුදලම වැයකර 2017 යල හා 2017/2018 මහ කන්නය තුළ වගාකර තිබුනේ අක්කර 540 ක් පමණි. නිකවැරටිය, කොටවෙහෙර, රස්නායකපුර හා ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ගොවීන්ට ලබාදී තිබූ රු.391,850 ක රටකජු බීජ කි.ග්‍රෑ.2,305 ක් පැල නොවන බවට ගොවීන් පැමිණිලි කර තිබුණි.

(ඇ) 2016 වර්ෂයේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ මාවතගම මීගොල්ල දම්පිටිය ඇල බෝක්කුව හා පාර සඳහා රු.340,675 ක වියදමක් දරා තිබුණද, මෙම මාර්ගයේ නිවාස 02 ක් පමණක් පිහිටා තිබුණ බැවින් රජයේ මුදල් උපරිම ඵලදායීතාවයකින් භාවිතා කර නොතිබුණි.

(ඈ) 2016 වර්ෂයේ විමධ්‍යගත මූලධන වැඩසටහන යටතේ පන්නල කම්මල්වත්ත ප්‍රදේශයේ නල ළිඳක් ඉදිකිරීම සඳහා වෙන්කර තිබුණ රු.375,000 ක ප්‍රතිපාදනවලින් භූ විද්‍යාත්මක සමීක්ෂණ ගාස්තු රු.38,517 ක් ගෙවා තිබුණද, නල ළිඳ ඉදිකිරීම අත්හැර දමා තිබුණු බැවින් එම මුදල නිෂ්ක්‍රීය වියදමක් බවට පත්වී තිබුණි.

(ඉ) විශේෂ සංවර්ධන දින 100 වැඩසටහන යටතේ මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2015 වර්ෂයේ ක්‍රියාත්මක වූ හල්වහල ජල යෝජනා ක්‍රමය සඳහා 2015, 2016 හා 2017 වර්ෂවලදී එකතුව රු.1,952,281 ක වියදමක් දරා තිබුණි. නමුත් ජල මෝටරය සවි කිරීමට අවශ්‍ය උපාංග මිලදී ගැනීමට රු.190,500 ක් වැය නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතිය නිෂ්කාර්යව තිබුණි.

(ඊ) 2016 වයඹ සංවර්ධන වැඩසටහන යටතේ රු.1,850,423 ක් වැයකර ඉදිකළ පොල්පිතිගම නිකවැහැර පානීය ජල ව්‍යාපෘතියේ ළිඳ ඉදිකිරීම නිමකර තිබුණි. නමුත් පානීය ජල ව්‍යාපෘතියට අදාල ටැංකිය, මෝටර් කාමරය හා ජල නල පද්ධතිය ඉදි නොකිරීම නිසා ව්‍යාපෘතිය ප්‍රයෝජනයට ගත නොහැකිව ඌන උපයෝජිතව පැවතුණි.

(උ) 2014 දැයට කිරුළ වැඩසටහනට සමගාමීව පොල්පිතිගම තලාකොලවැව ග්‍රාම නිලධාරී වසමේ රු.1,244,210 ක ඇස්තමේන්තු වටිනාකමකින් යුත් පානීය ජල ව්‍යාපෘතියෙහි ළිඳ ඉදිකිරීම අවසන් කර තිබුණි. නමුත් එහි පොම්පාගාරය හා ඉතිරි කටයුතු අවසන් වී නොතිබීම නිසා අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි.

**2.3.2 නිම නොකර අත්හැර දමන ලද ව්‍යාපෘති**

(අ) ග්‍රාමීය යටිතල පහසුකම් විශේෂ සංවර්ධන වැඩසටහන යටතේ පොල්පිතිගම මහවැව අසල සිට අගාරේ දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.491,510 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණද එම ව්‍යාපෘතිය නිම නොකර අත්හැර දමා තිබුණි.

(ආ) බිංගිරිය මානලෙම්බුව ග්‍රාම නිලධාරී වසමේ 2013 වර්ෂයේ වැඩ ආරම්භ කරන ලද ගැබිණි මව්වරුන් සඳහා සායන ගොඩනැගිල්ලට 2014 ගම නැගුම වැඩසටහන යටතේද රු.1,500,000 ක වියදමක් දරා තිබුණත් සායන කටයුතු සඳහා භාවිතා කිරීමට හැකි මට්ටමට වැඩ අවසන් කර නොතිබීම නිසා දරන ලද වියදම නිෂ්ක්‍රීය වියදමක් බවට පත්වී තිබුණි.

**2.4 වත්කම් කළමනාකරණය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වත්කම් ලේඛනගත කිරීම**

2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් සෑම ආයතනයකින්ම වත්කම් සම්බන්ධයෙන් තොරතුරු කැඳවා තිබුණද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තොරතුරු හා ඉඩම් සම්බන්ධ තොරතුරු 2018 ජූලි 25 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

(i) පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය | | |
|---|---|---|---|---|
| | | වසර 1-3 | වසර 3-5 | වසර 05 ට වැඩි |
| මෝටර් වාහන | 04 | 01 | 01 | 02 |
| බවුසර් | 02 | - | 01 | 01 |
| යතුරු පැදි | 01 | - | - | 01 |

(ii) 2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියේ දත්ත එකතු කිරීම සඳහා ග්‍රාම නිලධාරීන්ට නිකුත් කිරීමට පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලැබී තිබුණු ආකෘති පත්‍ර වර්ග 09 ක් හා ඇඟිලි සටහන් ගැනීමේ උපකරණ ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(iii) විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය විසින් පන්නල, ගල්ගමුව, වාරියපොල, නාරම්මල, අලව්ව, පොල්ගහවෙල පඩුවස්නුවර (නැගෙනහිර) යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පිහිටුවා ඇති විදාතා සම්පත් මධ්‍යස්ථානයන්හි එළවළු පළතුරු විජලන යන්ත්‍ර 06 ක්, බේකරි උඳුන් 06 ක්, යෝගට් නිෂ්පාදන යන්ත්‍ර 05 ක්, පොල් තෙල් හිඳින යන්ත්‍ර 05 ක්, හඳුන්කූරු නිෂ්පාදන යන්ත්‍රයක්, දර වායු ලිපක් වසර 05 කට අධික කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

(iv) පොල්පිතිගම හා නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ පිහිටි රජයට අයත් එකතුව අක්කර 27 රූඩ් 04 පර්චස් 03 ක ඉඩම් කැබලි 08 ක් හා ගොඩනැගිලි 18 ක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

## 2.5 අවිධිමත් ගනුදෙනු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) කුලියාපිටිය (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දැව බලපත්‍ර නිකුත් කිරීමේදී ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව දැව ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම් අවස්ථාවක් විය. එමෙන්ම ලී කඳන් ප්‍රවාහනය සඳහා ඉල්ලුම්කර ඇති ස්ථානයට බැහැරව කඳන් ප්‍රවාහනයට බලපත්‍ර නිකුත් කිරීම්, ලී කඳන් ප්‍රවාහන බලපත්‍රයේ සඳහන් කඳන්වලට වඩා වැඩි ප්‍රමාණයකින් හා වෙනත් ඉරූ දැව ප්‍රවාහනය වැනි අක්‍රමිකතාද පැවතුණි.

(ආ) පඩුවස්නුවර (නැගෙනහිර), රිදීගම, මාවතගම, වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පැවති 2017 ජනපති ජනතා සේවය වෙනුවෙන් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට රු.150,000 බැගින් ප්‍රතිපාදන ලැබී තිබුණි. මීට අමතරව ප්‍රජාවගෙන් රු.1,425,500 ක් එකතු කර රජයේ ගිණුම්වලට ගැනීමකින් තොරව වැයකර තිබුණි. රිදීගම හා වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මෙසේ රැස්කර තිබූ මුදලින් වියදම් නොවී ඉතිරි වූ එකතුව රු.134,425 ක මුදලක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එළදායිතා අරමුදලට බැරකර තිබුණි.

## 2.6 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) මාවතගම, කුලියාපිටිය (නැගෙනහිර) පඩුවස්නුවර (නැගෙනහිර), රිදීගම, වාරියපොල, වීරඹුගෙදර, උඩුබද්දාව, බිංගිරිය, පොල්පිතිගම යන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ තුළ 2014, 2015 හා 2016 වර්ෂවල එකතුව රු.1,611,358 ක රජයේ දායකත්වයක් යටතේ සමෘද්ධි දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කර තිබූ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති 86 ක් අසාර්ථකවී තිබුණි.

(ආ) දිළිඳුකමින් තොර ශ්‍රී ලංකාවක් බිහිකිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය මෙහෙයවනු ලැබූ ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ බෙදාහැරීම සඳහා 2017 දෙසැම්බර් මාසයේදී රු.492,057 ක් වටිනා උපකරණ හා රු.236,207 ක පැළ මිලට ගෙන තිබුණි. මෙම උපකරණ 2018 පෙබරවාරි මාසය තෙක් ගොවීන් වෙත බෙදා දී නොතිබුණ අතර, විගණනයේදී භෞතිකව පරීක්ෂා කළ රු. 24,000 ක් වටිනා කෙසෙල් පැළ 240 ක් හා රු.20,250 ක් වටිනා අන්නාසි පැළ 450 ක් විනාශ වී තිබුණි.

(ඇ) 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වර්ෂයන්හි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 29 ක ගිනි අවි හිමි පුද්ගලයන් විසින් ගිනි අවි සඳහා බලපත් ලබාගෙන නොතිබුණු අතර, මේ හේතුවෙන් දඩ මුදල් සමඟ රජයට අයවිය යුතු රු.678,600 ක මුදල 2018 මැයි 02 වන දින වන විටත් අයකරගෙන නොතිබුණි.

## 2.7 මහජනයා වෙත සේවා ඉටු කිරීම

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වෙබ් අඩවි නිර්මාණය කර තිබුණද, මහජනයාගේ පැමිණිලි ලබා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. 2018 මැයි 02 වන විට පවතින වෙබ් අඩවිවලින් වෙබ් අඩවි 28 ක් යාවත්කාලීන කර නොතිබුණි.

## 2.8 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 1,361.90 | 1,361.90 | - | - |
| | මූලධන | 36.50 | 36.34 | 0.16 | 0.45 |
| | එකතුව | 1,398.40 | 1,398.23 | 0.16 | 0.01 |
| 2014 | පුනරාවර්තන | 1,202.20 | 1,200.39 | 1.81 | 0.15 |
| | මූලධන | 362.25 | 359.37 | 2.87 | 0.79 |
| | එකතුව | 1,564.45 | 1,559.76 | 4.69 | 0.30 |
| 2015 | පුනරාවර්තන | 1,547.22 | 1,540.57 | 6.64 | 0.43 |
| | මූලධන | 54.00 | 44.09 | 9.91 | 18.35 |
| | එකතුව | 1,601.22 | 1,584.66 | 16.55 | 1.03 |
| 2016 | පුනරාවර්තන | 1,639.25 | 1,620.67 | 18.58 | 1.13 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මූලධන | 47.65 | 47.10 | 0.55 | 1.15 |
| | එකතුව | 1,686.90 | 1,667.77 | 19.13 | 1.13 |
| 2017 | පුනරාවර්තන | 1,636.05 | 1,627.09 | 8.96 | 0.55 |
| | මූලධන | 68.00 | 49.29 | 18.71 | 27.52 |
| | එකතුව | 1,704.05 | 1,676.38 | 27.67 | 1.62 |

**(අ) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

----------------------------

වැය විෂයයන් 11 ක් සඳහා එකතුව රු. මිලියන 61.81 ක අධි ප්‍රතිපාදන සලසා තිබුණි. එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 42.69 ක් පමණක් උපයෝජනය කිරිම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 05 සිට සියයට 36 ක පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ආ) වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

---------------------------------------------------------------------------------------

වෙනත් අමාත්‍යාංශ 35 ක්, දෙපාර්තමේන්තු 20 ක් හා කාර්යාල 02 ක් විසින් විවිධ කාර්යයන් සඳහා පිළිවෙලින් එකතුව රු.මිලියන 8,163 ක්, රු.මිලියන 1,223 ක් හා රු.මිලියන 47 ක් වශයෙන් එකතුව රු.මිලියන 9,433 ක් ප්‍රතිපාදන ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.මිලියන 6,419 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබාදී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 3,014 ක් හෙවත් සියයට 32 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- 2017 වර්ෂයේ අමාත්‍යාංශ 17 කින්, දෙපාර්තමේන්තු 07 කින් හා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් දිස්ත්‍රික් ලේකම් වෙත ලැබී තිබුණ ප්‍රතිපාදනවලින් සියයට 10 සිට සියයට 99.47 දක්වා පරාසයක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැතිව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් ව්‍යාපෘති 04 ක් සඳහා එකතුව රු.මිලියන 7.8 ක් ලබාදී තිබුණි. එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසා මුදල් වර්ෂය අවසන් වීමත් සමඟම ප්‍රතිපාදන අවලංගු වී තිබුණි.

**2.9 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

----------------------------------------

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

---------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල විෂයය අංක 27201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 112.00 | 100.18 | 88.00 | 88.07 | 300.00 | 275.57 |

විෂයය අංක 27201 දරන රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ 2017 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී එකතුව රු.744,100 ක්වූ හිඟහිටි ණය ශේෂය වර්ෂ 01 ක සිට වර්ෂ 18 දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟ ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි.

## 2.10 පොදු තැන්පත් ගිණුම

----------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 06 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 497.42 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 02 ක් ඉක්ම වූ රු.මිලියන 10.59 ක තැන්පතු 250 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) කුරුණෑගල, පොල්පිතිගම, කුලියාපිටිය (බටහිර), ගල්ගමුව සහ රිදීගම යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2015 වර්ෂයේ දෙසැම්බර් මස ව්‍යාපෘති 166 කට අදාලව පොදු තැන්පත් ගිණුමේ රු.මිලියන 7.03 ක් තැන්පත් කර තිබුණි. රඳවුම් මුදල් නිදහස් කිරීමට හෝ කර්මාන්තයේ අඩුපාඩු ඇත්නම් කොන්ත්‍රාත්කරු දැනුවත් කර එම අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමෙන් පසු මෙම තැන්පත් මුදල් නිදහස් කිරීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

(ඇ) මාර්ග සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අඹන්පොල හා රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබූ රු.232,646 ක් හා ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුව වෙතින් පඩුවස්නුවර (බටහිර) හා ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ලබාදී තිබූ රු.198,650 ක මුදල එම කාර්ය ඉටු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 2.11 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

------------------------------------------

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/ මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

## 2.12 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

### 2.12.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

-------------------------------------------------------------------------------------

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරිම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 1,509 ක් වැයකර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වාර්ෂික වියදම රු.299,042 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 136 | 129 | 07 |
| (ii) | තෘතියික මට්ටම | 72 | 40 | 32 |
| (iii) | ද්විතියික මට්ටම | 4,942 | 4,594 | 348 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 312 | 284 | 28 |
| | එකතුව | 5,462 | 5,047 | 415 |

**(අ) නිෂ්කාර්ය මානව සම්පත්**

(i) ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුබද්ධව පිහිටුවා ඇති විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානයට අනුයුක්තව විද්‍යා හා තාක්ෂණ නිලධාරියෙකු පත්කර නොතිබීම නිසා 2015 සිට 2017 දක්වා එම මධ්‍යස්ථානයේ කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක වී නොතිබුණි. මධ්‍යස්ථානය පවත්වාගෙන යාම වෙනුවෙන් දරනු ලැබූ ක්ෂේත්‍ර සම්බන්ධීකාරක වැටුප් හා විදුලි වියදම් එකතුව රු.1,245,118 ක වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

(ii) රිදීගම හා මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අදාලව කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් 2015 වර්ෂයේ සිට 2017 නොවැම්බර් දක්වා කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාලව ක්‍රියාත්මක කළයුතු වැඩසටහන් හා ඒවාට අදාල ප්‍රතිපාදන ලබා නොදීමෙන් එම කාර්යාලයට අනුයුක්ත කර සිටින කෘෂිකර්ම සංවර්ධන නිලධාරීන් 06 දෙනෙකුට ප්‍රමාණවත් රාජකාරී පවරා නොතිබුණි.